# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,508—1965 සැප්තැම්බර් 17 වැනි සිකුරාදා—1965.9.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගෙනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට, වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 687 | ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. .. | — |
| තනතුරු—ඇබෑර්තු .. .. .. .. | 693 | අය-වැය ලේඛන .. .. .. | 699 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. .. | — | දේපළ විකිණීම් .. .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. .. .. .. | 698 | මාර්ග කොමිටි දන්වීම් .. .. .. | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යට තේ දන්වීම් .. | 699 | විවිධ දන්වීම් .. .. .. | 704 |


[සැළකිය යුතුයි.—(1) 1963 ජනවාරි සිට ජූනි දක්වා නිකුත් අංක 13,457 සිට 13,690 තෙක් ඇති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවන්ට සූචියක් මෙම ගැසට් පත්‍රයට අතිරේකයක් වශයෙන් පළවේ. (2) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ V වැනි කොටසේ කුලී මෝටර් රථ සේවාවන් පැවැත්වීම සඳහා මගීන් ගෙන යාමේ අවසරපත් ඉල්ලීමේ අයදුම්පත් ලැයිස්තුවක් පළවේ.]

## පළාත් පාලන නිවේදන

### චාවකච්චේරි නගර සභාව

ප්‍රසිද්ධ රහ දැක්වීම් ආඥාපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රහ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් තමා කෙරෙහි පැවරී තිබෙන බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාව.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු මස 3 වැනි දින,
කොළඹ දී ය.

ව්‍යවස්ථාව

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රහ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ 1919 අප්‍රේල් 4 වැනි දින අංක 7,004 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලදුව 1943 අප්‍රේල් 9 වැනි දින අංක 9,103 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත ව්‍යවස්ථා ඒ ව්‍යවස්ථා චාවකච්චේරි නගර සභාවේ පාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට එහි අයි දරන ව්‍යවස්ථාව මගින් නියම කර ඇති ගාස්තු පරිමාණය වෙනුවට පහත සඳහන් අළුත් පරිමාණය ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධන කරනු ලැබේ.

| | එක් මසකට | එක් මසකට | (දෙසැම්බර් 31 වැනි දයින් අවසන් වන) එක් වර්ෂයකට |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ආසන පහසුකම් සලසා ඇති තැනැත්තන්ගේ ගණන 199 දෙනෙකුට වැඩි නොවන විට ... | 2 50 ... | 20 0 ... | 150 0 |
| ආසන පහසුකම් සලසා ඇති තැනැත්තන්ගේ ගණන 199 කට වැඩි එහෙත් 399 දෙනෙකුට වැඩි නොවන විට ... ... | 3 50 ... | 35 0 ... | 200 0 |
| ආසන පහසුකම් සලසා ඇති තැනැත්තන්ගේ ගණන 399 දෙනෙකුට වැඩි වන විට ... ... | 6 0 ... | 50 0 ... | 400 0 |

9-805—65. 9. 17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## නාවලපිටිය නගර සභාව

### ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, ඔහු විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාව.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965.8.25 වැනි දින,
කොළඹ දී ය.

### ව්‍යවස්ථාව

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ පනවනු ලැබ 1943 අප්‍රේල් මස 9 වැනි දින අංක 9,108 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත, 1919 අප්‍රේල් 4 වැනි දින අංක 7,004 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ ව්‍යවස්ථා, එහි අ3 වැනි ව්‍යවස්ථාවෙහි දක්වා ඇති ගාස්තුක්‍රමය වෙනුවට පහත දැක්වෙන අළුත් ගාස්තුක්‍රමය ආදේශ කිරීමෙන්, ඒ ව්‍යවස්ථා නාවලපිටිය නගර සභාවේ පරිපාලන සීමාවලට ඇතුළු වන ප්‍රදේශයට අදාළ වන තාක් දුරට මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

| | එක් දිනකට | එක් මාසයකට | එක් අවුරුද්දකට (දෙසැ. 31 වැනි දින අවසාන වේ.) |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 කට වැඩි නොවන කල්හි ... ... | 5 0 | ... 50 0 ... | 300 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 කට වැඩි නමුත් 399 කට වැඩි නොවන කල්හි ... | 10 0 | ...100 0 ... | 400 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 399 ට වැඩි කල්හි ... | 15 0 | ...150 0 ... | 500 0 |

නාවලපිටිය නගර සභාවට අදාළ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් 1948 ජූනි මස 4 වැනි දින අංක 9,873 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ නිවේදනය මෙයින් අවලංගු කරණු ලැබේ.

9–809—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## හම්බන්තොට නගර සභාව

### තානායම් පනත

(275 වෙනි අධිකාරය වන) තානායම් පනතේ 4 වෙනි වගන්තිය යටතේ, ඒ සඳහා උචිත බලධරයා වන හම්බන්තොට නගර සභාව විසින් හම්බන්තොට තානායම වෙනුවෙන් සම්පාදිතව, ඒ වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද ව්‍යවස්ථා.

ඇ. ඒ. ගෝගලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 25 දින,
කොළඹ දීය.

### ව්‍යවස්ථා

1. (1) තානායමේ යම් කොටසක් පාවිච්චි කරන හෝ එහි නැවතී සිටින සෑම තැනැත්තකු විසින්ම මීට යාකොට ඇති උපලේඛනයේ සඳහන් ප්‍රමාණ අනුව ගාස්තු හා අය කිරීම් ගෙවිය යුතුය.

එසේ වුවද වයස අවුරුදු 12ට අඩු ළමයින්ගෙන් ඉහත කී ගාස්තු ප්‍රමාණවලින් අඩක් පමණක් අය කළ යුතුය.

(2) පහත සඳහන් අය සම්බන්ධයෙන් ගාස්තු අය නො කළ යුතු ය :—

(අ) අත දරුවකු ;

(ආ) තානායමට පැමිණෙන අමුත්තෙකුගේ වැඩ කටයුතු කරමින් තානායම ඇතුළත නිදාගන්නා සේවකයකු සහ ;

(ඇ) මෝටර් රථයේ හෝ ගරාජයේ නිදා සිටින්නේ නම් තානායම් භූමියේ නවතා ඇති මෝටර් රථයක රියැදුරු.

2. (1) සෑම අමුත්තකු විසින්ම, තමා තානායමට ඇතුළුවූ විට තම නම සහ ලිපිනය අමුත්තන්ගේ සටහන් පොතේ පැහැදිලිව ලිවිය යුතුය.

(2) පූර්වෝක්ත ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන් සපුරා ලන තුරු කිසිම අමුත්තකු විසින් තානායමේ යම් කොටසක නැවතී නොසිටිය යුතුය. එමෙන්ම ඔහුට ආහාර පාන සැපයීමද නො කළ යුතුය.

3. (1) සභාපතිතුමාගේ ලියවිල්ලකින් වූ අවසරයක් නොමැතිව කිසිවකු විසින් අනුක්‍රමිකව දින තුනකට වඩා වැඩි කාලයක් තානායමේ යම් කොටසක නැවතී නො සිටිය යුතුය.

(2) ඉහත කී පරිදි අවසරය ලබා නොගෙන තානායමේ නැවතී සිටින සෑම අයෙකු විසින්ම තෙදින අවසානයේ දී තානායමෙන් ඉවත්ව යා යුතුය.

4. අමුත්තකු විසින් ගෙවනු ලබන සියලුම අයකිරීම් තානායම් භාරකරු විසින්, ඒ කාර්ය සඳහා තබා ඇති ලේඛනයෙහි ඇතුළත් කළ යුතුය.

5. අමුත්තකු විසින් ගෙවිය යුතු තානායම් අයකිරීම් ඉල්ලූ විට මුදලින් ගෙවිය යුතුය. එසේ ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් ඒ අමුත්තාට අවශ්‍ය දේ ඉදිරියට සැපයීම ප්‍රතික්ෂේප කිරීමට තානායම් භාරකරුට හිමිකම් තිබිය යුතුය.

6. (1) අඩු ගණනේ දිනකට කලින් වත් පොරොන්දු නො වූ යේ නම්, අමුත්තකු පැමිණීමට පෙර කාමරයක් වෙන් කර තැබීම නොකළ යුතුය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) ඡේදයේ විධි විධාන අනුව කාමරයක් කලින් වෙන් කර තැබූ තැනැත්තකු විසින් එය පරිහරණය කරනු නොලැබුව ද එහි ගාස්තු ගෙවිය යුතුය.

(3) කාමරයක් වෙන් කරවාගත් තැනැත්තා හෝ තැනැත්තන් පැමිණෙන තුරු ඒ කාමරය අවශ්‍යවන වෙනත් තැනැත්තකුගේ ප්‍රයෝජනය සඳහා දිය හැකිය.

7. එවන අයගේ නම සහ ලිපිනය විදුලි පුවතෙහි සඳහන් වී ඇත්නම් මිස, කෑම පිළියෙල කර තබන ලෙස ඉල්ලා එවනු ලබන යම් විදුලි පුවතක් අනුව ක්‍රියා කිරීමට තානායම් භාරකරු බැඳී නො සිටිය යුතුය.

8. තානායමේ ඇඳක්, සෝපාවක් හෝ කවිච්චියක්, ඒ මත ඇතිරිල්ලක් අතුරා ඇත්නම් මිස නිදාගැනීම සඳහා පාවිච්චි නොකළ යුතුය.

9. අමුත්තකු විසින් හානි කරන ලද හෝ කඩන ලද සියලුම දේවල වටිනාකම තානායමේ දැන්වීම් පුවරුවේ සඳහන් කර ඇති අය කිරීම් ප්‍රමාණය අනුව ඒ අමුත්තා විසින් ගෙවිය යුතුය.

10. (1) අමුත්තකු විසින් තානායම හෝ තානායම් භාරකරු පිළිබඳව කිරීමට අදහස් කරන යම් පැමිණිල්ලක් තානායමේ ඇති පැමිණිලි පොතේ සටහන් කළ යුතුය.

(2) අමුත්තකු විසින් පැමිණිලි පොත ඉල්ලූ විට එය ඉදිරිපත් කිරීම තානායම් භාරකරු සතු යුතුකම විය යුතුය.

(3) තානායමේ ගාස්තු ඇතුලත් කරනු ලබන ලේඛනයේ තානායම් පිළිබඳ විවේචන හෝ පැමිණිලි නො ලිවිය යුතුය.

11. (1) ප්‍රසිද්ධ දිවා භෝජන සංග්‍රහයක්, රාත්‍රී භෝජන සංග්‍රහයක්, උද්‍යානෝත්සවයක් හෝ වෙනත් පිළිගැනීමේ උත්සවයක්, හෝ සාදයක්, සභාපතිගේ ලිඛිත අවසරය ඇතිව මිස, තානායම් භූමියේ නො පැවැත්විය යුතුය. එවැනි ප්‍රසිද්ධ දිවා භෝජන සංග්‍රහයක්, රාත්‍රී භෝජන සංග්‍රහයක්, උද්‍යානෝත්සවයක්, හෝ වෙනත් පිළිගැනීමේ උත්සවයක් හෝ සාදයක්, තානායමේ නැවතී සිටින අමුත්තන්ට යම් කරදරයක් නොවන අයුරු පැවැත්විය යුතුය.

(2) (1) වෙනි උපඡේදයේ නිශ්චිතව සඳහන් කාර්යයන්ගෙන් යම් කාර්යයක් සඳහා සම්පූර්ණ තානායම හෝ එහි කොටසක් පාවිච්චි කිරීමට සභාපති විසින් ඉඩ දෙන අවස්ථාවක—

(අ) පැමිණෙන තැනැත්තන්ගේ ගණන 24 ට වැඩි නො වන අවස්ථාවක (මීට යාකොට ඇති උපලේඛනයේ දක්වා තිබෙන ගාස්තු වෙනුවට) ප්‍රථම පැය 6ට රුපියල් 15 ක් බැගින් හා සෑම අතිරේක පැයකට හෝ ඉන් කොටසකට

රුපියල් 2 බැගින්, සහ (2) පැමිණෙන තැනැත්තන්ගේ ගණන 24 ට වැඩි වන අවස්ථාවක, මීට යාකොට ඇති උපලේඛනයේ නිශ්චිතව සඳහන් ප්‍රමාණ අනුව නැවතී සිටීම පිළිබඳ අයකිරීම්,

සභාව වෙත ගෙවිය යුතු ය.

12. තානායමේ නැවතී නොසිටින අයට වඩා ඇත්ත වශයෙන්ම එහි නැවතී සිටින අයට තානායමට සම්බන්ධ වූ ගරාජයක් හෝ ඉස්තාලයක් පාවිච්චි කිරීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

13. තානායමේ ගරාජයක නතර කර තිබෙන හෝ තානායම් භූමිය ඇතුළත යම් ස්ථානයක නවතා තිබෙන පෞද්ගලික වාහනයක අයිතිකරු හෝ එය කුලියට ගත් තැනැත්තකු විසින්, තමා තානායමේ නැවතී නොසිටියද, ඒ වාහනය නවතා තිබීමේ හෝ ගරාජය පාවිච්චි කිරීමේ ගාස්තුවට අමතර වශයෙන් එකී වාහනය එසේ නතර කොට හෝ නවතා තිබෙන කාලය තුළ තානායමේ නැවතී සිටීමේ උචිත ගාස්තු ව ද ගෙවිය යුතු ය.

14. මේ ව්‍යවස්ථා වලින් යම් ව්‍යවස්ථාවක් කඩ කිරීමේ වරදට වරද කරු වූ යම් අමුත්තකු විසින් තානායම පාවිච්චි කිරීම සභාපතී විසින් තහනම් කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

15. අසභ්‍ය කාර්යයක් සඳහා කිසිවෙකුට තානායමේ හෝ ඉන් කොටසක නැවතීමට තානායම් භාරකරු විසින් අවසර නොදිය යුතුය.

16. තානායම පාවිච්චි කරන වෙනත් අයට හිරිහැරයක් වෙන අයුරු අමුත්තකු හෝ අමුත්තකුගේ සේවකයකු අනිසි ලෙස නො හැසිරිය යුතුය.

17. තානායමට සුනඛයෙකු ගෙන ඒමට කිසිම අමුත්තකුට අවසර නො දිය යුතුය.

18. සභාවට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් තානායමේ නැවතී සිටින රජයේ යම් සේවකයකුගෙන්, මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් නැවතී සිටීමේ ගාස්තු ප්‍රමාණවලින් අඩක් අය කළ යුතුය.

19. (1) තානායමේ දුර කථනයෙන් ලබා ගන්නා බාහිර දුර කථන ඇමතුම් එය ලබා ගන්නා අය විසින් ඒ කාර්ය සඳහා තබා ඇති ලේඛනයේ සටහන් කළ යුතුය.

(2) බාහිර ඇමතුමක් සඳහා දුර කථනය පාවිච්චි කරන සෑම අමුත්තකු විසින් බාහිර ඇමතීම් සඳහා තැපැල් කාර්යාලයයට ගෙවිය යුතු නියමිත ගාස්තුව ගෙවිය යුතුය.

(3) දුර කථනය පාවිච්චි කිරීමට පෙර (2) වන ඡේදයේ නිශ්චිතව සඳහන් ගාස්තු තානායම් භාරකරුට ගෙවිය යුතු අතර අවශ්‍ය නම් ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත හැක.

(4) ගාස්තු කලින් නොගෙවා කිසිම අමුත්තකු විසින් දුර කථනය පාවිච්චි නොකළ යුතුය.

(5) බාහිර ඇමතුමක් ලබා ගැනීමට අදහස් කරන අමුත්තකු විසින් අවශ්‍ය විස්තර ඒ ඇමතීම් සඳහා වූ අයකිරීම් සමග තානායම් භාර කරුට දිය යුතුය.

20. තානායමේ නැවතී නොසිට තානායමේ දුර කථනය පරිහරණය කරන සෑම තැනැත්තකු විසින්ම, දුර කථනය පාවිච්චි කිරීමේ ගාස්තු වලට අතිරේකව ඒ අය තානායමේ නැවතී සිටින කාලය සඳහා ගෙවිය යුතු නැවතී සිටීමේ ගාස්තු ගෙවිය යුතුය.

21. මෙම ව්‍යවස්ථා වලින් යම් ව්‍යවස්ථාවක් කඩකිරීම සම්බන්ධයෙන් රු. 50 ට වැඩි නොවන දඩයක් සහිත දඬුවම් පැමිණවිය යුතුය.

22. මෙම ව්‍යවස්ථාවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ;

"සභාව" යනුවෙන් හම්බන්තොට, නගර සභාව අදහස් වේ;

එමෙන්ම

"තානායම" යනුවෙන් හම්බන්තොට තානායම අදහස් වේ.

23. 1945 සැප්තම්බර් 14 දින අංක 9,459 දරන ගැසට් පත්‍රයෙන් පළ කොට, වරින් වර සංශෝධනය කරනු ලැබූ හම්බන්තොට තානායමට අදාළ ව්‍යවස්ථා හෝ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කරනු ලැබේ.

## උපලේඛනය

## නැවතී සිටීමේ ගාස්තු

1. තානායමේ (නිදන කාමරයක් නොවන) කොටසක් පාවිච්චි කරන සෑම අයෙකු සම්බන්ධයෙන්—

| | රු. ශ. |
|---|---|
| (අ) පැය 6ට වැඩි නොවන යම් කාලයක් සඳහා ... | |
| (1) ප්‍රථම පැය හෝ ඉන් කොටසක් සඳහා ... | .50 |
| (2) සවස තේ හැරුණු විට වෙනත් ආහාර ගන්නේ නම්, ශත 30ක අඩුම ගාස්තුවකට යටත්ව සෑම අතිරේක පැය හෝ ඉන් කොටසක් සඳහා ... ... | .50 |
| (ආ) පැය 6 ට නො අඩු සහ පැය 24 ට නො වැඩි අඛණ්ඩ කාලයක් සඳහා ... ... | 3.00 |

| | |
|---|---|
| 2. තානායම් භාරකරු විසින් නො සපයනු ලබන ආහාර යක් තානායමේ සිට ගැනීම සම්බන්ධයෙන් තානායමේ (නිදන කාමරයක් නොවන) කොටසක නැවතී සිටින තැනැත්තකුට සලසන සේවාවන් සඳහා ... | 1.00 |
| 3. (අ) අංක 12, 13, 14, 15 හෝ 16 දරන කාමරවල නැවතීමට එක් දිනක් හෝ ඉන් කොටසක් සඳහා එක් තැනැත්තකු නැවතී සිටින විට ... | 7.50 |
| එක් තැනැත්තකුට වඩා වැඩි ගණනක් නැවතී සිටින විට එක් අයෙකුට ... ... | 6.00 |
| (ආ) අංක 1, 2 හෝ 3 දරන කාමරවල නැවතීමට එක් දිනයක් හෝ ඉන් කොටසක් සඳහා එක් තැනැත්තකු නැවතී සිටින විට ... ... | 6.00 |
| එක් තැනැත්තකුට වඩා වැඩි ගණනක් නැවතී සිටින විට එක් අයෙකුට ... ... | 5.00 |
| (ඇ) අංක 7, 8, 9, 10 හෝ 11 දරන කාමරවල නැවතීමට එක් දිනයක් හෝ ඉන් කොටසක් සඳහා එක් තැනැත්තකු නැවතී සිටින විට ... | 5.00 |
| එක් තැනැත්තකුට වඩා වැඩි ගණනක් නැවතී සිටින විට එක් අයෙකුට ... ... | 5.00 |
| (ඈ) අංක 4, 5 හෝ 6 දරන කාමරවල නැවතීමට එක් දිනයක් හෝ ඉන් කොටසක් සඳහා—එක් තැනැත්තකු නැවතී සිටින විට ... | 5.00 |
| එක් තැනැත්තකුට වඩා වැඩි ගණනක් නැවතී සිටින විට එක් අයෙකුට ... ... | 4.00 |

එසේ වුවද විදේශීය පදිංචිකරුවන්ගේ ගාස්තු පහත සඳහන් සේ විය යුතුය:—

| | |
|---|---|
| අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10 හෝ 11 දරන කාමර වල නැවතීමට එක් අයෙකුට එක් දිනක් හෝ ඉන් කොටසක් සඳහා— ... ... | 7.50 |
| අංක 12, 13, 14, 15 හෝ 16 දරන කාමරවල නැවතීමට එක් අයෙකුට එක් දිනක් හෝ ඉන් කොටසක් සඳහා— ... ... ... | 10.00 |
| 4. සභාපතිගේ අවසරය ඇතිව තානායමේ යම් කාමරයක මාසයක් තුළ නැවතී සිටින තැනැත්තකු සම්බන්ධයෙන් ඒ කාමරය ද්විත්ව කාමරයක් නම් ... ... ... | 75.00 |
| ඒ කාමරය තනි කාමරයක් නම් ... ... | 50.00 |
| 5. (අ) තානායම් භාරකරුගෙන් ආහාර නොලබා තානායමේ කාමරයක නැවතී සිටින තැනැත්තකුට සේවය කිරීම සඳහා දිනකට ... ... | 1.00 |
| (ආ) පස්වරු 11 සිට පෙරවරු 6 දක්වා වූ කාලය තුළ තානායමේ ආහාර පාන සපයනු ලබන එක් එක් තැනැත්තකු සම්බන්ධයෙන් ඒ ආහාර පාන වල ගාස්තුවට අතිරේකව දිනකට ... ... | 2.00 |

6. ගරාජයේ නවතා තිබෙන මෝටර් රථයක් හෝ වෙනත් වාහනයක් සඳහා—

| | |
|---|---|
| (අ) පැය 12ට වැඩි නොවන කාලයක් සඳහා ... | .50 |
| (ආ) පැය 12ට වැඩි එහෙත් පැය 24ට වැඩ නොවන කාලයක් සඳහා ... ... | 1.00 |

9–808—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය

ඇල්. ඩී.—බී. 67/36.

## කල්මුනේ සුළු නගර සභාව

### ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති වරයා විසින් පනවන ලද ව්‍යවස්ථාව.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965.8.25 වැනි දින,
කොළඹ දී ය.

### ව්‍යවස්ථාව

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ සම්පාදනය කරනු ලැබ 1919 අප්‍රේල් මස 4 වැනි දින අංක 7,004 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලදුව 1943 අප්‍රේල් 9 වැනි දින අංක 9,108 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථාවෙන් අවසන් වරට සංශෝධිත ව්‍යවස්ථා, ඒ ව්‍යවස්ථා කල්මුනේ සුළු නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත ප්‍රදේශයට අදාල වන ප්‍රමාණයට එහි අ 3 වැනි ව්‍යවස්ථාවේ දක්වා ඇති ගාස්තු පරිමානය වෙනුවට පහත සඳහන් අළුත් පරිමානය ආදේශ කිරීමෙන් මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

| | දින නවයකට වැඩි නොවන කාල සීමාවක් සඳහා | දින නවයකට වැඩි වන නමුත් මාස එකකට වැඩි නොවන කාල සීමාවක් සඳහා | එක් මසකට වැඩිවන නමුත් හය මසකට වැඩි නොවන කාල සීමාවක් සඳහා | හය මසකට වැඩි වන නමුත් දහ මසකට වැඩි නොවන කාල සීමාවක් සඳහා | දහ මසකට වැඩි වන නමුත් එක් අවුරුද්දකට වැඩි නොවන කාල සීමාවක් සඳහා |
| --- | --- | --- | --- | --- | --- |
| | | රු. ශ. | | රු. ශ. | රු. ශ. |
| ආසන පහසුකම් සලසා ඇති තැනැත්තන්ගේ ගණන 300ට වැඩි නොවන විට | දිනකට රු. 3 බැගින් ගණන් බලන ලද ගාස්තුවක් | 25 0 ... | මසකට හෝ ඉන් කොටසකට රු. 25 බැගින් ගණන් බලන ලද ගාස්තුවක් | 150 0 ... | 250 0 |
| ආසන පහසුකම් සලසා ඇති තැනැත්තන්ගේ ගණන 300 ට වැඩි වන නමුත් 500කට වැඩි නොවන විට | දිනකට රු. 5 බැගින් ගණන් බලන ලද ගාස්තුවක් | 50 0 ... | මසකට හෝ ඉන් කොටසකට රු. 50 බැගින් ගණන් බලන ලද ගාස්තුවක් | 250 0 ... | 400 0 |
| ආසන පහසුකම් සලසා ඇති තැනැත්තන්ගේ ගණන 500 ට වඩා වැඩි වන විට | දිනකට රු. 10 බැගින් ගණන් බලන ලද ගාස්තුවක් | 100 0 ... | මසකට හෝ ඉන් කොටසකට රු. 100 බැගින් ගණන් බලන ලද ගාස්තුවක් | 400 0 ... | 500 0 |

9-807—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය

---

## මීගමුව මහ නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (1956 සංශෝධනය—272 අධිකාරය) 17 වැනි ඡේදය යටතේ නියෝගයයි

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (1956 සංශෝධිතය—272 අධිකාරය) 17 ඡේදය ප්‍රකාර නිසි බලධාරී, මීගමුව නගර සභාව පහත සඳහන් දිනයේ දී එම නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ විකිණීම සම්පූර්ණයෙන් තහනම් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

දිනය : 1965 ඔක්තෝබර් 2 වැනි ද—"සත්ව දිනය"

ඒ. වී. චින්නයියා,
මීගමු නාගරික කොමසාරිස්.

1965 සැප්තැම්බර් 3 වැනි ද,
මීගමු මහ නගර සභා කාර්යාලයේ දී ය.

9-831—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය

---

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ මැදපළාත කෝරළේ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව, 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදන යෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද, පොදු අතුරු ව්‍යවස්ථාවල XXXVIII වැනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දින සිට සම්මත කර ගැනීමට මැදපළාත කෝරළේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

යා. මු. විජයරත්න,
සභාපති.

මැදපළාත කෝරළේ ගම්සභා කාර්යාලයය.
තෙරිපැහැ—හල් ග්‍රන්ඔය,
1965 ජූනි මස 1 වැනි දින දීය.

9-835—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය.

---

ඇල්. ඩී.—බී 39/50.

## මාණිපෙ සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වැනි වගන්ති යටතේ මාණිපෙ සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

1965 අගෝස්තු මස 25 දින,
කොළඹ දී ය.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ සථිර ලේකම්.

### රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා

1946 ඔක්තෝබර් 4 වැනි දින අංක 9,609 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද ව්‍යවස්ථාවල 211 වැනි ව්‍යවස්ථාව යටතේ සැපයීමට නියමිත උපලේඛනය ඒ ව්‍යවස්ථා මාණිපේ සුළු නගර සභාවට අදාළවන ප්‍රමාණයට නො සැපයිය යුතුය.

9-806—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය

## කොහොක ගම්සභාව

### ගම්සභා ආඥපනත—198 වෙනි පරිච්ඡේදය

නුවරඑළි දිස්ත්‍රික්කයේ කොහොක ගම්සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

වී. මූ. අංබරත්න,
කොහොක ගම්සභාවේ සභාපති තැන.

ගම්සභා කාර්යාලය,
කොහොක, කරඳගොල්ල,
1965.9.4.

### යෝජනාව

1952 අංක 6 දරන ප්‍රදේශාධිකාරි පොදු අතුරු ව්‍යවස්ථා ආඥපනතේ 3 වෙනි උප වගන්තිය යටතේ කොහොක ගම්සභාව විසින් 1954 ඔක්තෝබර් මස 22 වෙනි දින අංක 10,726 දරණ ''ගැසට්'' පත්‍රයේ පලකරන ලද යෝජනාවෙන් සම්මත වූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වෙනි කාණ්ඩයේ 1 වෙනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් දැක්වෙන දිග හා පළල අනුව සාද හෝ නැවත සාද පවත්වා ගෙන යායුතුයයි බී. ඒ. සී. ප්‍රනාන්දු මහතා කල යෝජනාව එච්. අංබිගුණසේකර මහතා ස්ථිර කලෙන් ඒකත්වන්දයෙන් සභා සම්මත විය.

#### අංක 1—වදවල කොටස

| අංකය | පාරේ නම | දිග හැතැක්ම | පළල අඩි |
|---|---|---|---|
| 1 | කරඳගොල්ලේ සිට වෙලපහලට යන පාර | 1½ | 5 |
| 2 | කරඳගොල්ලේ සිට ඇල්ලේඔයට යන පාර | 1½ | 6 |
| 3 | වදවල සිට කපුකොටුව හරහා මැදගම්මැද්දට යන පාර | 1½ | 6 |
| 4 | කරඳගොල්ලේ සිට ඌරාකෙම්පේ ගම මැදපාලම ලගට යන පාර | 2 | 6 |
| 5 | කෝපිකඩේ සිට වදවලට යන කරත්ත පාර | 1¼ | $2_4$ |
| 6 | වදවලට යන කරත්තපාරේ සිට යක්කාවගේ අගලේ පාර | ⅛ | 4 |
| 7 | මැදගම්මැද්දට යන ගම්සභාපාරේ සිට කලවැල් මඩිත්තේ හරස්පාර | ¾ | 5 |
| 8 | කපුකොටුවේ ගෝරමේන්තුගේ බෝගහලග සිට ඌරා කෙම්පෙ ගම්සභා පාරට වැටෙන පාර | ¼ | 5 |
| 9 | ගෙපලගෙදර ගාව සිට කපුකොටුවේ ගම්සභා පාරට වැටෙන පාර | ¼ | 4 |
| 10 | ඇල්ලේහේනේ සිට දියබුබුලේ ගමට යන පාර | ¼ | 5 |
| 11 | කොලොන්ගහමුල සිට බෝධිඇලට යන පාර | ¼ | 5 |
| 12 | බෝමළුවේ සිට ඇල්ලේඔයේ පාලම ලගට යන පාර | ½ | 6 |
| 13 | කේ. බී. රත්නායකගේ ගේලග සිට මීවක හරහා වදවල ගමට යන පාර | ½ | 6 |
| 14 | වෙලේගෙදර වත්ත ලග සිට අරාවේගම මැදට යන පාර | ¼ | 5 |
| 15 | කොලොන්ගහ ලග සිට අටලහවත්ත හරහා බෝධිඇලට වැටෙන පාර | ¼ | 5 |

#### අංක 2—බඩලගම කොටස

| අංකය | පාරේ නම | දිග හැතැක්ම | පළල අඩි |
|---|---|---|---|
| 16 | අලවත්තේ ගම සිට අතුරන්දවෙලට යන පාර | 1¼ | 5 |
| 17 | අලවත්තාගමේ සිට රිකිල්ලගස්කඩට යන ගොන් තවලම් පාර | 1¼ | 8 |
| 18 | මැලමුරයේ සිට කන්නරුගේ හන්දියට යන අඹගැටේ පාර | ½ | 4 |
| 19 | කුන්පලහප්පුවේ සිට බඩලගමට යන පාර | ¼ | 4 |
| 20 | දුරකඩකුඹුරේ ඇලේ සිට අඹගැටේ පාරට යන අතුරු පාර | ½ | 4 |
| 21 | බඩලගමමැද සිට අලවත්තේ ගමට යන මැටි වලවේ පාර | ¼ | 4 |
| 22 | අලවත්තේ ගම මැද පාර | ¼ | 4 |

#### අංක 3—පල්ලේවෙල කොටස

| අංකය | පාරේ නම | දිග හැතැක්ම | පළල අඩි |
|---|---|---|---|
| 23 | කහන්පත්තා ඔයේ සිට ගමේ කරත්ත පාරට | ¾ | 6 |
| 24 | කුඩුගලතැන්න සිට පී. ඩබ්ලිව්. ඩී. පාර දක්වා යන පාර | ¼ | 6 |
| 25 | කුඹුක්වල සිට පී. ඩබ්ලිව්. ඩී. පාර දක්වා යන පාර | ¼ | 6 |
| 26 | අඹගහමුල පිහිල්ලේ සිට කරත්ත පාර දක්වා යන පාර | 1 | 6 |
| 27 | නිකතැන්නේ වැවේ සිට ඇතැපැදිතැන්න හරහා කරත්ත පාරට | 1 | 6 |
| 28 | ලීමගහමුල හේනේ සිට දඹගහමඩිත්ත කුඹුර දක්වා යන පාර | ½ | 6 |
| 29 | කැටබිල්ලා ගහමුල කඳුරේ සිට හින්න පිටකුඹුක් මඩිත්ත ලගින් ඩී. ආර්. සී. පාරට | ½ | 6 |
| 30 | පහලගමේ අරඹේ ගම්සභා පාරේ සිට ඉහගහ තැන්නේ පී. ඩබ්ලිව්. ඩී. පාරට | 1 | 6 |
| 31 | දෙමටේගෙදර වත්ත ලග සිට පුහුල්ගහේනේ සිරිකට ඇල දක්වා යන පාර | ¾ | 6 |

#### අංක 4—බෝගමුව කොටස

| අංකය | පාරේ නම | දිග හැතැක්ම | පළල අඩි |
|---|---|---|---|
| 32 | දිඹුල්කුඹුරේ සිට මීරිය කැටිය හරහා රුප්පේපතන පාර | 1½ | 6 |
| 33 | මොරහෙලේ පාර | 1 | 8 |
| 34 | නිකතැන්නේ පාර | 1½ | 6 |
| 35 | පනම්ගමුවේ පාර | 1¼ | 7 |
| 36 | පනම්ගමුවේ සිට දිඹුල්කුඹුර දක්වා යන පාර | ¾ | 6 |
| 37 | දිඹුල්කුඹුරේ සිට දඹගොල්ල යන පාර | 1 | 3 |

#### අංක 5—මකුරුප්ප

| අංකය | පාරේ නම | දිග හැතැක්ම | පළල අඩි |
|---|---|---|---|
| 38 | බෝගමුවේ සිට නිකතැන්න හරහා බෝධිඇලට යන පාර | 1½ | 4 |
| 39 | වැලකින්නේ සිට මහපිටියේ සුසානභූමියට යන පාර | ½ | 6 |
| 40 | මකුරුප්පේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාරේ සිට සුසාන භූමියට යන පාර | ¼ | 6 |
| 41 | මකුරුප්පේ ඩී.ආර්.සී. පාරේ සිට වැලමිටිකහව ලගට පාර | ¼ | 4 |
| 42 | උඩ රුකුලේ සිට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාරට යන පාර | 1 | 6 |
| 43 | පද්දරාවේ සිට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාරට යන පාර | ⅛ | 4 |
| 44 | බෝධිඇලේ සිට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාරට යන පාර | 1 | 6 |
| 45 | බෝමළුවේ සිට මහපිටිය සුසාන භූමිය දක්වා යන පාර | ¾ | 6 |
| 46 | කපුගෙදර ඩී.ආර්.සී. පාරේ සිට පී.ඩබ්ලිව්. ඩී.පාරට | ½ | 4 |
| 47 | කරත්ත පාරේ සිට දෙමෝදරට යන පාර | ½ | 4 |

#### අංක 6—දෙහිපේ කොටස

| අංකය | පාරේ නම | දිග හැතැක්ම | පළල අඩි |
|---|---|---|---|
| 48 | දෙහිපේ පාලම ලග සිට අමුනුමුල්ලට යන පාර | 2 | 6 |
| 49 | කම්මල ලග සිට එම ගමමැද පාර | 1 | 6 |
| 50 | දඹතලාවේ පාර | ½ | 6 |
| 51 | මීවනා කොටුවේ පාර | ½ | 6 |
| 52 | බල්ලන් ඇල්ල පාර | ¼ | 4 |
| 53 | අඹකොටේ සිට මැදගම්මැද්දට යන පාර | ½ | 4 |

#### අංක 7—ඇල්ගම කොටස

| අංකය | පාරේ නම | දිග හැතැක්ම | පළල අඩි |
|---|---|---|---|
| 54 | නුවර-රාගල ප්‍රසිද්ධ පාරේ හැකිරිලන්ද සිට කටකිතුල දක්වා යන ඩී.ආර්.සී. පාර | 3 | 20 |
| 55 | කොස්වත්තේ සිට බල්ලන් ඇල්ල කඳුර දක්වා යන අඹුරුවැල්ල පාර | 2 | 6 |
| 56 | ඇල්ගම ගමමැද හෙවලිය පාර | ¾ | 6 |
| 57 | නුවර-රාගල ප්‍රසිද්ධ පාරේ සිට බෝධිමල්කඩ පාර | 1 | 20 |
| 58 | මැදගම්මැද්ද පාර | ½ | 6 |
| 59 | නාරන්ගස්පිටිය පාර | ¼ | 6 |
| 60 | ඇල්ගම මහ ඇලේ සිට කොස්වත්ත හරහා ගල්ලිඳහේන පාර | ¼ | 6 |
| 61 | කිතුල ගහවල නායේ පාර | ¾ | 6 |
| 62 | දෙනිය ගම මැද පාර | ¼ | 6 |
| 63 | දිඹුල් ලියද්ද පාර | ⅛ | 3 |
| 64 | හාලි ඇල්ල පාර | ⅛ | 4 |
| 65 | පිටවල කුඹුරු මැද පාර | ¼ | 5 |
| 66 | තැන්පත් වත්ත පාර | ⅛ | 3 |
| 67 | අලකොටුව පාර | ¼ | 3 |
| 68 | බෝධිමල්කඩ සිට දරපොකුන ආදිමහපාර මැග ගම්මැද්ද දක්වා | 1 | 6 |
| 69 | දෙනියගම සිට සියඹලාගහ පාර | ¼ | 3 |

### අංක 8—හියදල කොටස්

| අංකය | පාරේ නම | දිග හැතැක්ම | පළල අඩි |
|---|---|---|---|
| 70 ... | කඳුර කඩේසිට හියදල හරහා වෙලපහල කහන් පත්තා ඔය දක්වා යන පාර ... ... | 2½ ... | 6 |
| 71 ... | මලකඳුරේ සිට නාපිටිතැන්න හරහා නිලියඔට යන පාර ... ... ... | ¾ ... | 6 |
| 72 ... | බෝධිමල්කඩ පාරේ සිට හියදලට යන පාර ... | ½ ... | 6 |
| 73 ... | බෝධිමල්කඩ සිට වෙලපහල ගමට යන පාර ... | ½ ... | 20 |
| 74 ... | හියදල ගම් මැද ගම්සභා පාරේ සිට හැත්බැලැන්ද සොහොන්පිටිය හරහා නිළියඔට යන අඩි පාර | ¾ ... | 4 |
| 75 ... | හියදල, වෙලපහල, කහන්පත්තා ඔය දක්වා යන ගම්සභා පාරේ සිට ගමේ වෙලමැදින්, මා ඇල දක්වා යන පාර ... ... | ½ ... | 6 |
| 76 ... | ගම මැද ගම්සභා පාරේ උඩපන්ගුව ලගින් ගම මැදින් පොල්කොටුවට යන පාර ... | ¼ ... | 6 |
| 77 ... | කහන්පත්තා ඔයට යන පාරේ සිට නාලගම වෙල්යායේට යන පාර කුඩුගොල තැන්න දක්වා | 1½ ... | 5 |

### අංක 9—කොටස දෙනිකේ

| අංකය | පාරේ නම | දිග හැතැක්ම | පළල අඩි |
|---|---|---|---|
| 78 ... | දෙනිකේ හීන්නේ පාර ... ... | ¼ ... | 8 |
| 79 ... | පොල්කොටුවේ වංගුවේ සිට පොරමඩුල්ලට යන පාර ... ... ... | ¼ ... | 12 |
| 80 ... | මහනුවර-රාගල පාරේ සිට මැද පතන රිකිල්ල ගස්කඩ යන පාර ... ... | 1 ... | 4 |
| 81 ... | නුවර-රාගල පාරේ සිට දිනදේවයලැ පාර ... | ⅛ ... | 3 |
| 82 ... | නුවර-රාගල පාරේ සිට වෙල්යායේට යන වෝන්ටන් වතු පාර ... ... | ⅛ ... | 3 |
| 83 ... | නුවර-රාගල පාරේ සිට කහට දෙනියේ වෙල් යායේට යන පාර ... ... | ¼ ... | 3 |
| 84 ... | හීන්නේ පාරේ සිට මඩුගහඋයනට යන පාර ... | ¾ ... | 4 |
| 85 ... | නුවර-රාගල පාරේ සිට වැවලන්දට යන පාර ... | ½ ... | 4 |
| 86 ... | නුවර-රාගල පාරේ සිට නායේ වෙල්යායේට යන පාර ... ... ... | ⅛ ... | 4 |
| 87 ... | නුවර-රාගල පාරේ සිට උඩවෙල වෙල්යායේට යන වෝන්ටන් වතු පාර ... ... | ½ ... | 4 |
| 88 ... | මකුරුප්පෙ ප්‍රසිද්ධ මහ පාරේ සිට මැදපතන හරහා අංගඩවෙල පන්සල ලග යන පාර ... | ¾ ... | 8 |

### අංක 10—උදළුමඩ කොටස

| අංකය | පාරේ නම | දිග හැතැක්ම | පළල අඩි |
|---|---|---|---|
| 89 ... | පොරමඩුල්ලේ සිට උදළුමඩ මැදින් වෙලම්පා ගොඩ සංගිලි පාලම දක්වා යන පාර ... | 1½ ... | 10 |
| 90 ... | පොරමඩුල්ලේ සිට දෙනිකේ මැදින් නුවර-රාගල පාරට යන පාර ... ... | ¾ ... | 8 |
| 91 ... | උදලුකඩ සිට කලගොල්ල හරහා පොරමඩුල්ල කොලනිය දක්වා යන පාර ... | ¾ ... | 8 |
| 92 ... | හපුගහවක සිට ඉලංගමුව පිහිල්ල දක්වා යන පාර | 1¼ ... | 3 |
| 93 ... | පිටහවත්ත සිට දූනුකැල්ල පිහිල්ල දක්වා යන පාර | ½ ... | 4 |
| 94 ... | පොරමඩුල්ලේ කොලනිය සිට දුරුන්දෙනිය හරහා බෝපිටියට යන පාර ... | ¾ ... | 3 |
| 95 ... | පිටහවත්ත සිට නාරන්කොටුව හරහා ප්‍රසිද්ධ පාරට වැටෙන පාර ... ... | ½ ... | 3 |
| 96 ... | පොරමඩුල්ල කොලනිය මැදින් ක්‍රීඩාපිටියට යන පාර ... ... ... | ¼ ... | 10 |
| 97 ... | පිටහවත්ත සිට විල්වල දක්වා යන පාර ... | 1½ ... | 3 |

### අංක 11—ඇහැලමල්පේ කොටස

| අංකය | පාරේ නම | දිග හැතැක්ම | පළල අඩි |
|---|---|---|---|
| 98 ... | කරඳගොල්ලේ සිට කොරහගොඩ පාර ... | ¼ ... | 6 |
| 99 ... | කරඳගොල්ල සිට ඇහැලමල්පේ මීවක පාර ... | ⅛ ... | 6 |
| 100 ... | තුන්පොලහපුව සිට බුළුගහපිටිය පාර ... | 1 ... | 12 |
| 101 ... | ඇහැලමල්පේ සිට දේදුනුඅමුන දක්වා යන පාර ... | ⅛ ... | 6 |

### අංක 12—විලවල කොටස

| අංකය | පාරේ නම | දිග හැතැක්ම | පළල අඩි |
|---|---|---|---|
| 102 ... | උළුකඩේ සිට ගොඩගම හරහා රටිලන් වත්ත දක්වා යන පන්සල ඇල්ලේ පාර ... | 2 ... | 6 |
| 103 ... | කෙහෙල්වත්තේ සිට දෙහිපේ දක්වා යන දඹතලා වේ පාර ... ... ... | ½ ... | 6 |
| 104 ... | කරඳගොල්ලේ සිට හිත්ත ලියද්ද හරහා ගල් කොටුවේ පාර ... ... | ¾ ... | 6 |
| 105 ... | කොරහගොඩ පාලම ලග සිට යන පිංපැලේ පාර... | ¼ ... | 4 |
| 106 ... | කොරහගොඩ පාලම ලග සිට දූල්වෙල කුඹුරේ පාවුලින් මීරියකඩ ඇල දක්වා යන පන්වත්තේ පාර ... ... ... | ¼ ... | 4 |
| 107 ... | ගනාගෙදර වත්තේ සිට පිංපැල දක්වා යන විල්වල ගම මැද පාර ... ... | ¼ ... | 4 |
| 108 ... | ගොඩගම පන්වත්තේ පාරේ සිට වඩුවල මැදින් තුන්පොලහපුව බුලුගහපිටිය පාර දක්වා යන වෙල මැද පාර ... ... | ½ ... | 4 |
| 109 ... | උදළුමඩ ගලබොඩතැන්නේ පාර ... | 1½ ... | 12 |
| 110 ... | ඉල්ලියද්දේ කුඹුර ලග සිට විල්වල රජමහා විහාරය දක්වා යන ගොඩගන්ලන්දේ පාර ... | ½ ... | 4 |
| 111 ... | ගල්කොටුවේ කිතුලේගල කුඹුර මැදින් රටලන් වත්ත දක්වා යන පාර ... ... | ¾ ... | 4 |
| 112 ... | බුලුගහපිටියේ ප්‍රසිද්ධ පාරේ සිට හිත්තරාගහ තැන්න දක්වා යන රථවාහන පාර ... | 3 ... | 12 |

9–829—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ආඩිඅම්බලම ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

" පළාත් පාලනය පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දවූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි 8 වැනි දින අංක 14,287 දරණ ගැසැට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය, මේ යෝජනාව ගැසට් පත්‍රයේ පලවන දින සිට සම්මත කර ගැනීමට, ආඩිඅම්බලම ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු අදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (260 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

කේ. ඩී. එච්. ද ඇස්. කරුණාරත්න,
සභාපති, ආඩිඅම්බලම ගම්සභාව.

1965 ක්වූ සැප්තැම්බර් මස 3 වැනි දින,
ආඩිඅම්බලම ගම්සභා කාර්යාලය,
සීදූව.

9–818—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය

## ගම්සභා ආඥාපනත

### 17 වැනි වගන්තිය යටතේ දන්වීමයි

1961 අංක 60 දරන පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17 (5) දරන වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර, නැගෙනහිර කොටස (පහළ) පළාත් පාලන සහකාර කොමසාරිස්, ඇන්තනි ඇල්ප්‍රඩ් ජෝසප් වන මා විසින් අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරෙයිපත්තු මධ්‍යම ගම් සභාවට සභාපති වරයෙකු තෝරා පත්කර ගැනීම සඳහා රැස්වීමක්, 1965 සැප්තැම්බර් මස 27 වෙනි දින පෙරවරු 10.30 ට අක්කරෙයිපත්තු මධ්‍යම ගම් සභා කාර්යාලයේ දී මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ඇ. ඇ. ජෝසප්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
නැගෙනහිර (පහළ) කොටස.

1965 සැප්තැම්බර් මස 11 වෙනි දින,
පළාත් පාලන දෙපාර්තමේන්තුව,
නැගෙනහිර කොටස (පහළ)
මඩකලපුව.

9–839—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ අඹන්ගඟ කෝරළේ ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින, අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 හේ ජනවාරි මස 8 වැනි දින, අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද, පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල XXXVIII කාණ්ඩය, මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කරගැනීමට අඹන්ගඟ කෝරළේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

එච්. ඇම්. පී. හේරත්,
අඹන්ගඟ කෝරළේ ගම්සභාවේ
සභාපති තැන.

1965 ක්වූ අගෝස්තු මස 23 වැනි දින,
ගම්මඩුව, අඹන්ගඟ කෝරළේ ගම්සභා
කාර්යාලයේ දී ය.

9–836—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය

---

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ රුස්සගල ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින, අංක 14,287 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල XXXVIII වැනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට රුස්සගල ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ක. පියදාස,
රුස්සගල ගම්සභාවේ සභාපති.

1965 අගෝස්තු මස 16 වැනිදා,
රුස්සගල ගම්සභා කාර්යාලයේදී යැ,
රුස්සගල.

9–831/1—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය

---

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ රුස්සගල ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953නේ අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරන ගැසැට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මංඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953නේ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට අංක 37 දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට රුස්සගල ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ක. පියදාස,
රුස්සගල ගම්සභාවේ සභාපති.

1965 අගෝස්තු මස 16 වැනිදා,
රුස්සගල ගම්සභා කාර්යාලයේදී යැ,
රුස්සගල.

9–834/2—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය

---

# තනතුරු–ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**1. දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අතිත් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලන ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිති වාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවක යන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්ද, ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම්ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනකට ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

4. නව ප්‍රවේශක නිලධාරීහු.—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝගවලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්ටත්" නියම කරනු ලැබෙයි.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළත දී සිංහල භාෂාව විෂයයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේ දී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංහලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මේ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකිවන අතර, නියමිත කාල සීමාවෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුළතදී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමත් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍යභාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලන්න).

(ඇ) අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.— ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම් වශයෙන් නියම් කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුවකුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සාමාර්ථයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ ඉවන්ත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.)

(ඈ) කාර්යක්‍ෂමතා කඩයිම්.—පත්වීම් ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2 ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේ දී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධිවිධාන බලපවත්වනු ඇත.

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

* සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකික යකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සිංලුම් කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවා මුක්ත හටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනටූ, ඔවුන්ගේ නිත්‍ය හට යමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය හට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට තමන් සූදානම් ව සිටිත් ද නැත් දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට සම් භාව්‍ය තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන් දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම්පත් වනාහි මීට යාකොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙල කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපෑලේ දී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාල සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාල වෙනම වෘත්තීය ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 . වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

————තනතුර සඳහා වූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය: ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැදහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස:

අවුරුදු——, මාස——, දින————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි).

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාල සීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය: ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම් :—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත් නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.
(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය

### යන්ත්‍රාගාර ක්‍රියාකරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරුවා පළමුවන වරට කොළොන්නාව පළාත් ආණ්ඩු සභාවට පත් කරනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත වර්ෂික වැටුප් ක්‍රමය රු. 1,320—72—රු. 2,184.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස: 1965.10.5 දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 35 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ පහත සඳහන් විභාග වලින් සමත් වී සිටිය යුත්තාහ :—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර පරීක්ෂණයේ හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර පරීක්ෂණයෙන් (සාමාන්‍ය පෙළ) විෂයයන් හයකින් ලත් සාමාර්ථය. මෙම විෂයයන් හයෙන් හතරක් සිංහල/දෙමළ, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ගණිතය විය යුතුයි. භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ගණිතයට සම්මාන සාමාර්ථය ලත් අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඇ) පිළිගත් වෙළඳ සමාගමක හෝ රජයේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවක කර්මාන්තශාලා පුහුණුව පිළිබඳව යටත් පිරිසෙයින් දෙවර්ෂයක පළපුරුද්ද, එවැනි පළපුරුද්දක් සතු බව ඔප්පුකරන සහතිකයක් ඇමිණිය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1965.10.5 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාර ගනු ලබන්නේ, ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසු ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ.

අත්සන,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530,
කොළඹ, 1965 සැප්තැම්බර් මස 7 වැනි දින දීය.

9-814—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කම්බිකරු සහායක තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි.

2. වැටුප :තනතුරට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 504—30×8—744.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) වයස : 65.10.5 දිනට වයස අවුරුදු 20 ට නොඅඩුව අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන්ට සිංහල හෝ දෙමළ භාෂා දෙකෙන් එකක් ලියන්නට හා කථා කිරීමට හැකි වියයුතු අතර, විදුලිය බෙදා හැරීමේ කම්බි වැඩ පිළිබඳ යටත් පිරිසෙයින් තුන් අවුරුදු පළපුරුද්දක් ඇතිව සිටිය යුතුය. නාගරික විදුලි ආලෝක ව්‍යාපාරයන්හි වැඩ කර පළපුරුදු අය කෙරෙහි සහ/හෝ ලංකා කාර්මික විද්‍යාලයේ විදුලිය කම්බි ඇදීම පිළිබඳ එක් අවුරුදු සන්ධ්‍යා පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇති අය කෙරෙහි වැඩි සැලකිලි දක්වනු ලැබේ.

ඉහත සඳහන් පළපුරුද්ද හා දැනුම සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම්පත්වලට අමුණා එවිය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 65.10.5 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාර දී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. තෝරා ගනු ලබන අපේක්ෂකයින් තමන් පත්කරන පළාත් පාලන ආයතනයේ සීමාව තුළ පදිංචි වීමට අවශ්‍ය විය හැක.

9. අවශ්‍ය සුදුසුකම් ඇති ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

අත්සන,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1965 සැප්තැම්බර් මස 8 දින,
තැ. පෙ. 530,
කොළඹ.

9-832—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### දෙවැනි ශ්‍රේණියේ බෙහෙත්ශාලා භාර ආයුර්වේද වෛද්‍ය තනතුරු

පළාත් පාලන සේවයේ දෙවැනි ශ්‍රේණියේ බෙහෙත් ශාලා භාර ආයුර්වේද වෛද්‍ය තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව ඉල්ලුම් පත්‍ර කැඳවයි.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 960—72×17—රු. 2,184 ; එහි රු. 1,608 වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) අයදුම්කරුවෝ, 1949 අංක 49 දරන දේශීය වෛද්‍ය සංශෝධන ආඥාපනතේ දෙවැනි ඔගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබුවෝ විය යුත්තාහ.

(ආ) අයදුම්කරුවන්ට ලංකා ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයේ ස්වදේශීය වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය කර්ම විධි පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ ඊට සමාන සහතිකයක් හෝ ලංකාවේ හෝ ඉන්දියාවේ පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයක වඩා උසස් සහතිකයක් හෝ තිබිය යුතු අතර, ඩිප්ලෝමා සහතිකය ලැබීමෙන් පසු සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයකු ලෙස අවුරුදු 5 කට නොඅඩු කාලයක් වෛද්‍ය කර්මයෙහි යෙදී සිටි පළපුරුද්ද තිබිය යුතුයි.

(ඇ) සුප්‍රසිද්ධ ගුරු වෛද්‍යවරයකු යටතේ යටත් පිරිසෙයින් පස් වර්ෂයක ශිෂ්‍ය භාවයෙහි යෙදීමෙන් පසු සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයෙකු ලෙස වර්ෂ 10 කට නොඅඩු කාලයක් තුළ කරන ලද ව්‍යාප්ත වෛද්‍ය අභ්‍යාසයක් ඇති, පිළිගත් සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයන්ගේ ඉල්ලුම් පත්‍රද, මීට ඉහතින් සඳහන් කරන ලද සුදුසුකම් නොතකා සලකා බලනු ලැබේ. එබඳු අයදුම්කරුවෝ සාමාන්‍ය ආයුර්වේද වෛද්‍ය වරයෙකු ලෙස වෛද්‍ය කර්මයෙහි යෙදීමේ පළපුරුද්ද පිළිබඳව දක්වා ඇති වර්ෂ ගණන සනාථ කිරීම සඳහා ප්‍රදේශයේ වැදගත් පුද්ගලයන් තිදෙනෙකුගෙන් සහ ගුරු වෛද්‍යවරයාගෙන් ලබාගත් සහතික පිටපත් ද ඉල්ලුම් පත්‍රවලට ඇමිණිය යුත්තාහ.

(ඇ) රසායනික බෙහෙත් වර්ග අළලා වෙදකම් කිරීමේ පළපුරුදුකම් තිබේ නම්, එය සනාථ කිරීම පිණිස ලබාගත් සහතික පිටපත් ඉල්ලුම් පත්‍රවලට ඇමිණිය යුත්තාහ.

4. තෝරාගනු ලැබූ අපේක්ෂකයාට පෞද්ගලික වෛද්‍ය කර්මයෙහි යෙදීමට අවසර නැත. ආයුර්වේද බෙහෙත් ශාලාවන්ට ආසන්නයෙහි පදිංචි වන ලෙස ඔහුට නියම කරනු ඇත.

5. අයදුම්කරුවෝ සවකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලිපි පිටපත් (මුල් පිටපත් නොවේ.) ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ ආධාර ලබන පාඨශාලාවල රෙගුලාසි පද්ධතිය වෙනුවෙන් නිකුත් කරන ලද සහතික හෝ දිවුරුම් පෙත්සම් නොපිළිගනු ලැබේ).

(ආ) සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයෙක් ලෙස වෛද්‍ය කර්මයෙහි යෙදීමේ පළපුරුද්ද පිළිබඳව දක්වා ඇති වර්ෂ ගණන සනාථ කිරීම සඳහා ප්‍රදේශයේ වැදගත් පුද්ගලයන් තිදෙනෙකුගෙන් ලබා ගන්නා ලද සහතික. (එහි පළපුරුද්ද පිළිබඳ කාල පරිච්ඡේදය සඳහන් විය යුතුයි.)

6. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම් පත්‍ර, පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි යටතේ සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි සාරානුකූලව පිළියෙල කොට, 1965.10.5 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. පූර්වෝක්ත ආකෘති පත්‍රයෙහි 13 වැනි ශීර්ෂය වෙනුවට පහත සඳහන් කොට ඇති කරුණු යොදගත යුතුය :—

"13. (i) සුදුසුකම් ලැබීමෙන් පසු සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයෙක් ලෙස වෛද්‍ය කර්මයෙහි යෙදීම ආරම්භ කළ දිනය. (එය සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අමුණන්න) :———.

(ii) ආයුර්වේදයේ එක්තරා අංශයක් විශේෂයෙන් අධ්‍යයනය කළේ ද? එසේ නම් විස්තර දක්වන්න :———.

(iii) ආයුර්වේද පිළිබඳ සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුයි) :———.

(iv) සුදුසුකම් ලැබූ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ නම :———.

(v) සුදුසුකම් ලැබූ දින :———.

(vi) 1949 අංක 49 දරන සවදේශීය වෛද්‍ය සංශෝධන ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ ලේඛනයෙහි හෝ සාමාන්‍ය ලේඛනයෙහි ලියා පදිංචි වූ අංකය :———."

8. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. නියමිත දිනට පසුව, රජයේ සේවයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවය කරන නිලධාරීන්ගෙන් මේ කාර්යාලයට ලැබෙන අයදුම් පත්‍ර, නියමිත දින හෝ ඊට පළමු ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, නාගරික කොමසාරිස්වරයා, ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපතිවරයා වෙත ලැබී, ප්‍රමාදය පිළිගත හැකි හේතු දක්වමින් ඒ අයදුම් පත්‍ර පිළිගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා, නාගරික කොමසාරිස්වරයා හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපතිවරයා විසින් නිර්දේශ කරනු ලැබුවහොත් මිස, සලකා බලනු නොලැබේ.

10. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට සති 3 ක් ඇතුළත සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට පමණක් ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1965.9.11 දින,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530, කොළඹ.

9-840—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර

### ගෝනාපීනුවල-මීටියාගොඩ ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය :** වර්ෂයකට රුපියල් 540—30×8—24×1 රු.804 ; රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) **වයස :** 1965 ඔක්තෝබර් මස 5 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 30ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙළ කොට, 1965 ඔක්තෝබර් මස 5 වැනි දිනට හෝ ඊට පළමු ගෝනාපීනුවල-මීටියාගොඩ ගම්සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

කේ. පී. ආරියදාස,
ගෝනාපීනුවල-මීටියාගොඩ ගම්සභාවේ සභාපති.

1965 අගෝස්තු මස [illegible] වැනි දින,
ගෝනාපීනුවල-මීටියාගොඩ ගම්සභා කාර්යාලයේ දී ය.

9-273—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### වින්නඹු සේවිකා තනතුර—ගාල්ල නාගරික සභාව

ඉහත සඳහන් තනතුර සඳහා ගාල්ල නගරයේ විශේෂ කොමසාරිස් විසින් අයදුම්පත් කැඳවයි.

2. **වැටුප.**—තනතුරට නියමිත වැටුප් ක්‍රමය, වර්ෂයකට රු. 666—15 × 42—රු. 1,296. වර්ෂයකට රු. 1,086 යන වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) **වයස :** 1965 ඔක්තෝබර් 5 වෙනි දිනට වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමාගේ දක්ෂතා පිළිබඳ සහතික දරණ ලියාපදිංචිවූ වින්නඹු සේවිකාවෝ විය යුතුය. සෞඛ්‍ය මණ්ඩල වැඩ ගැන පළපුරුද්දක් ඇති සිංහලෙන් හා දෙමළෙන් කථා කළහැකි අය ගැන විශෙෂයෙන් සලකා බලනු ලැබේ.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1965 ඔක්තෝබර් 5 වැනි දිනට හෝ ඊට පළමු ගාල්ල නගරයේ විශේෂ කොමසාරිස් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ වන අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ ගාල්ල නගරයේ විශේෂ කොමසාරිස් වෙත මිස, කිසිම නිලධාරියෙකුගේ **පෞද්ගලික නමට නොවේ.**

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වා එවනු ලැබේ. යම්කිසි අයදුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රය, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින හතක් ඇතුළත ලැබුණු බව දන්වා එවනු නොලැබුවහොත් වහාම ඒ බව ගාල්ලේ නාගරික කොමසාරිස් වෙත දැන්විය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, තම ඉල්ලුම් පත්‍රය සළකා බැලීම සඳහා ඇති යම්කිසි හිමිකමක් වෙයි නම් එය නැති වන්නේ ය.

කේ. ෂන්මුගම්,
ගාල්ල නගරයේ විශේෂ කොමසාරිස්.

1965 සැප්තැම්බර් 3 දින,
නගර ශාලාව,
ගාල්ල.

9-476—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඩී. බී. 122/37—ප. පා. දෙ.—බීබී. 510

## බණ්ඩාරවෙල නගරසභාව

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය) වන නගරසභා ආඥාපනතේ 130 (ආ) සහ 153 වෙනි වගන්ති යටතේ බණ්ඩාරවෙල නගර සභාව විසින් සම්පාදිතව, එම ආඥාපනතේ 154 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත්පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත්පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 25 දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

(255 වැනි අධිකාරය වන) නගරසභා ආඥාපනතේ 130 (ආ) වගන්තිය යටතේ පනවනු ලැබ අය කරනු ලබන අංක 14,427 හා 1965 ජූනි මස 18 වන දින දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1965 ජූනි මස 8 වන දින දරන නිවේදනයේ සඳහන් ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දෙන් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපළ 1965 වර්ෂයට නිදහස් කළ යුතුය.

### උපලේඛනය

පහත සඳහන් වරිපනම් අංක දරන දේපළ :—

**අංක 1 දරන ඡන්ද කොට්ඨාශය**

පන්සල පාර : අංක 50/1

පූනාගල පාර : අංක 45/1, 45/2, 45/3, 45/4, 45/7 සහ 8, 45/9, 45/10, 55, 55/2, 55/3, 55/4, 55/5, 55/6, 55/8 සහ 55/10.

**අංක 3 දරන ඡන්ද කොට්ඨාශය**

පන්සල පාත් : අංක 17, 17/1, 17/2, 23, 23/1, 25 සහ 6.

**අංක 4 දරන ඡන්ද කොට්ඨාශය**

වැලිමඩ පාර : අංක 39/1, 41, 41/1, 41/2, 41/3, 41/4, 45, 45/4 සහ 55.

**අංක 5 දරන ඡන්ද කොට්ඨාශය**

ඇටැම්පිටිය පාර : අංක 10, 10/1, 10/2, 10/3, 16, 24, 24/1, 23/2, 24/3, 24/4, 28, 30, 30/1, 32, 34 සහ 36.

**අංක 6 දරන ඡන්ද කොට්ඨාශය**

අපර්ඩ්‍රයිව් පාර : අංක 48.

9–804—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී 28/64.

## චාවකච්චේරි නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වන අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153(1) හා 157 වන වගන්ති යටතේ චාවකච්චේරි නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 154(1) වැනි වගන්තියෙන් තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

1953 ජනවාරි 23 වන දින අංක 10,496 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවෙන් සංශෝධිත, 1949 සැප්තැම්බර් 16 වන දින අංක 10,016 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවල 243 වන අතුරු ව්‍යවස්ථාව වෙනුවට මෙහි පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් ඒ අතුරු ව්‍යවස්ථා මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"243 පොදු වෙළඳ පොළේ යම් කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් ප්‍රමාණයන් අනුව වූ ගාස්තුවක් අය කරනු ලැබ ගෙවිය යුතු ය :—

| | රු. ශ. |
|---|---|
| (අ) අඩි 4×අඩි 4 කට වැඩි නොවන විවෘත ඉඩ ප්‍රමාණයක් සඳහා ... ... | 25 |
| (ආ) අඩි 6×අඩි 6 කට වැඩි නොවන විවෘත ඉඩ ප්‍රමාණයක් සඳහා ... ... | 35 |
| (ඇ) හතරැස් අඩි 36 කට වැඩි මුත් හතරැස් අඩි 60 කට නොවැඩි විවෘත ඉඩ ප්‍රමාණයක් සඳහා ... | 50 |
| (ඈ) හතරැස් අඩි 60 කට වැඩිමුත් හතරැස් අඩි 100 කට නොවැඩි විවෘත ඉඩ ප්‍රමාණයක් සඳහා ... | 65 |
| (ඉ) අඩි 10×අඩි 10 කට නොවැඩි ආවර්තිත ඉඩ ප්‍රමාණයක් සඳහා ... ... | 1 50 |
| (ඊ) අතිරේක හැම හතරැස් අඩි 100 හෝ ඉන් කොටසක් සඳහා ... ... | 1 00 |
| (උ) අඩි 4×අඩි 4 ක මාළු වෙළඳ පොළේ ආවර්තිත ඉඩ ප්‍රමාණයක් සඳහා ... ... | 50 |
| (ඌ) හතරැස් අඩි 16 කට වැඩිමුත් හතරැස් අඩි 36 කට නොවැඩි ආවර්තිත ඉඩ ප්‍රමාණයක් සඳහා ... | 1 00 |
| (එ) හතරැස් අඩි 36 කට වැඩිමුත් හතරැස් අඩි 60 කට නොවැඩි ආවර්තිත ඉඩ ප්‍රමාණයක් සඳහා ... | 1 50 |
| (ඒ) හතරැස් අඩි 60 කට වැඩිමුත් හතරැස් අඩි 100 කට නොවැඩි ආවර්තිත ඉඩ ප්‍රමාණයක් සඳහා ... | 2 00 |
| (ඔ) අතිරේක හැම හතරැස් අඩි 25 ක්ම හෝ ඉන් කොටසක් සඳහා ... ... | 25 |

(2) පොදු වෙළඳ පොළෙහිදී විකිණීම සඳහා ගෙනෙනු ලබන පහත සඳහන් බඩු සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රමාණයන් අනුව වූ ගාස්තුවක් ගේට්ටුවේ දී අය කරනු ලැබ ගෙවිය යුතු ය :—

| | රු. ශ. |
|---|---|
| (අ) බඩු බාහිරා අඩංගු අඩි 3×අඩි 2 ගෝනියක් සඳහා... | 25 |
| (ආ) හතරැස් අඩි 6 කට වැඩිමුත් හතරැස් අඩි 8 කට අඩු ගෝනි සඳහා ... ... | 35 |
| (ඇ) ලොකු ප්‍රමණයේ කූඩා (නා හෝ ඕලා පොතු කූඩා)... | 15 |
| මධ්‍යම ප්‍රමාණයේ කූඩා (නා හෝ ඕලා පොතු කූඩා) | 10 |
| කුඩා ප්‍රමාණයේ කූඩා (නා හෝ ඕලා පොතු කූඩා)... | 05 |
| (ඈ) පක්ෂීන් (කුකුළු, තාරා දී පක්ෂීන්) එකෙකුට ... | 10 |
| (ඉ) සතුන් : එළුවන් හා බැටළුවන් ... ... | 50 |
| හරකුන් ... ... | 1 00 |
| ඌරන් හෝ වල් ඌරන් ... | 3 00 |
| මූවන් ... ... | 3 00 |
| ගෝනුන් ... ... | 3 00 |
| හාවුන් ... ... | 15 |
| තලගොයින් ... ... | 15" |

9–810—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

# පළාත් පාලන සහා ජන්ද ආඥාපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

(262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 66 (2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙළින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්.
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1965 සැප්තැම්බර් මස 7 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | අපේක්ෂකයාගේ නම |
|---|---|
| මහනුවර දිස්ත්‍රික්කය | |
| පාතහේවාහැට ගන්දහය උතුර ගම්සභාව | |
| 12 | ... වීරසූරිය විජේසුන්දර රාජපක්ෂ වාසල මුදියන්සේලාගේ ලොකු බණ්ඩා |
| පුත්තලම දිස්ත්‍රික්කය | |
| ආනෙයිවිලුන්දන් පත්තු ගම්සභාව | |
| 16 | ... වාප්ප සාහිබ් මරිකාර් නවුතා මරිකාර් |

9–820—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

(262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 36 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයන් ඔවුන්ගේ නම්වලට කෙළින් ඇති ඒ ඒ කොට්ඨාශවල නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1965 සැප්තැම්බර් මස 7 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | අපේක්ෂකයාගේ නම |
|---|---|
| යාපනය දිස්ත්‍රික්කය | |
| මල්ලකම් ගම්සභාව | |
| 11 ... | සින්නප්පු කනගනායගම් |
| මඩකළපුව දිස්ත්‍රික්කය | |
| මන්මුනෙයි ඊශාන (උතුරු කොටස) ගම්සභාව | |
| 3 | වයිරමුත්තු, නල්ලතම්බි |

9–819—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## අය වැය ලේඛන

### මාතර නගරය

**මූ. රෙ. 12 (ii) යටතේ අයදුම්පතයි**

1965 අයවැය ලේඛනය

වැය ශීර්ෂයන්ගෙන් ඉතිරිවන මුදල් පහත සඳහන් අතිරික්තයන් පියවා ගැනීම සඳහා 1965 සැප්තැම්බර් මස 9 වැනි දින මාතර නගරය පාලනය කිරීමට පත්කර ඇති විශෙෂ කොමසාරිස් විසින් සම්මත කරන ලදී :—

| ශේෂය | රු. | ශ. | අතිරික්තය | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඊ 5 (ඇෆ්)—ණය ගාස්තු ... ... | 18,400 | 0 | ඒ 2 (ඇල්) —අතිකාල දීමනා ... ... | 250 | 0 |
| | | | ඒ 3 — ආපසු ගෙවීම් ... ... ... | 100 | 0 |
| | | | බී 7 — සතුකොට ගැනීම් ... ... | 50 | 0 |
| | | | සී 2 — නඩත්තු කිරීම් ... ... | 1,000 | 0 |
| | | | සී 3 — දැවබඩු හා උපකරන ... ... | 5,000 | 0 |
| | | | ඩී 5 — දැවබඩු ... ... ... | 1,500 | 0 |
| | | | ඩී 7 — නව කර්මාන්ත ... ... | 1,000 | 0 |
| | | | ඊ 2 (ජී)— කසල ගොඩගැසීම් සඳහා වියදම් ... | 1,000 | 0 |
| | | | ඊ 7 (බී)— නඩත්තු කිරීම් ... ... | 1,000 | 0 |
| | | | ඇෆ් 1— වේතන ... ... ... | 3,000 | 0 |
| | | | ජේ 1 (ඊ)—අතිකාල දීමනා ... ... | 1,500 | 0 |
| | | | ඇම් 2— පොත්පත් හා සඟරා ... ... | 3,000 | 0 |
| | 18,400 | 0 | | 18,400 | 0 |

එච්. ඒ. පී. අභයවර්ධන,
මාතර නගරයේ විශෙෂ කොමසාරිස්.

1965 සැප්තැම්බර් මස 9 වැනි දා,
මාතර, විශෙෂ කොමසාරිස් කාර්යාලයයේ දී ය.

## 1965 පළමුවන පරිපූරක අය වැය ලේඛනය

| ශීර්ෂ හා උප ශීර්ෂය | විස්තරය | මුදල රු. | ශ. |
|---|---|---|---|
| ඒ 2 (එච්)— | කරත්ත හා බෝට්ටු කහඩු ගාස්තු ... | 150 | 0 |
| ඒ 3— | ආපසු ගෙවීම් ... ... ... | 350 | 0 |
| බී 7— | සතුකොට ගැනීම් ... ... | 4,150 | 0 |
| ඩී 7— | නව කර්මාන්ත ... ... | 3,000 | 0 |
| අයි 2— | බඩුබාහිරාදිය ගැන වියදම් ... ... | 200 | 0 |
| ජේ 1 (එෆ්)— | විදුලිබලය මිළදී ගැනීම ... ... | 500 | 0 |
| කේ 1— | ගිණි නිවන උපකරණ නැවත පිරවීම ආදියෙහි ගාස්තු | 500 | 0 |
| | | 8,850 | 0 |

පිළිගෙන සම්මත කරන ලදී.

එච්. ඒ. පී. අභයවර්ධන,
මාතර නගරයේ විශේෂ කොමසාරිස්.

1965 සැප්තැම්බර් මස 9 වැනි දා,
මාතර, විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ දී ය.

9–825—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## ගම්පහ පළාත් ආණ්ඩු සභාව

### 1965 වර්ෂයේ පළමුවන පරිපූරක වැය ලේඛනය

| වැය සිරස හෝ උප වැය සිරස | මුදල රු. | ශ. | යෝජනා අංකය සහ දිනය |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම— | | | |
| 2(ඊ) අධිකරණ ගාස්තු ... ... ... | 2,000 | 0 | 65.6.25 දින යෝජනා අංක 27 |
| 2(අයි) ගණන් පරීක්ෂක ගාස්තු ... ... | 400 | 0 | 65.7.30 දින යෝජනා අංක 30 |
| 4. ආධාර මුදල් සහ දීමනා ... ... | 1,000 | 0 | 65.1.29 දින යෝජනා අංක 40 |
| සී.—තානායම් සහ අම්බලම්— | | | |
| 2. නඩත්තුව ... ... ... | 3,500 | 0 | 65.8.27 දින යෝජනා අංක 23 |
| 3. ගෘහ භාණ්ඩ සහ උපකරණ ... ... | 1,000 | 0 | 65.3.12 දින යෝජනා අංක 8 |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි— | | | |
| 7. නව කර්මාන්ත ... ... ... | 24,000 | 0 | 65.6.25 දින යෝජනා අංක 27 |
| 10. ඉඩම් සහ ගොඩනැගිලි අත්කර ගැනීම ... ... | 6,500 | 0 | 65.7.30 දින යෝජනා අංක 30 |
| ඊ.—මහජන සෞඛ්‍යය— | | | |
| 2(බී) කරත්ත, ගොනුන් සහ ලොරි ... ... | 5,000 | 0 | 65.8.27 දින යෝජනා අංක 23 |
| 3 (බී) කරත්ත, ගොනුන් සහ ලොරි ... ... | 8,000 | 0 | 65.7.30 දින යෝජනා අංක 30 |
| 7 (බී) නඩත්තුව ... ... ... | 5,000 | 0 | 65.8.27 දින යෝජනා අංක 23 |
| 7 (ඩී) ඉදිකිරීම් ... ... ... | 2,300 | 0 | 65.6.25 දින යෝජනා අංක 27 |
| ජේ.—විදුලිය දෙපාර්තමේන්තුව— | | | |
| 3 (ඒ) ද්‍රව්‍යය ... ... ... | 5,000 | 0 | 65.8.27 දින යෝජනා අංක 23 |

සී. ආර්. ඒ. සමරක්කොඩි,
ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

නගර සභා කාර්යාලය,
ගම්පහ, 65.9.6.

9—803/1—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## ගම්පහ පළාත් ආණ්ඩු සභාව

### මුදල් රෙගුලාසි නීති අංක 12 (II) යටතේ කෙරෙන අයදුම් පත්‍රයයි

1965 අය වැය ලේඛනයේ ඇම්. 6 වැය සිරසෙන් ඉතිරි වේයයි ගණන් බලන ලද මුදල ඇම්. 2 වැය සිරසේ වැඩිපුර වැය වේයයි බලාපොරොත්තු වන මුදල පියවීම සඳහා මාරු කිරීමට 1965 අප්‍රේල් 30 වැනි දින පැවැත්වූ ගම්පහ පළාත් ආණ්ඩු සභා රැස්වීමේ දී අංක 16 දරණ යෝජනාවෙන් සම්මත විය.

| ඉතිරිවේයයි බලාපොරොත්තු වන වැය සිරස | රු. | ශ. | වැඩිපුර වැයවේයයි බලාපොරොත්තුවන වැය සිරස | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඇම්.—කියවීම් ශාලා— | | | ඇම්.—කියවීම් ශාලා— | | |
| 6. ඉදිකිරීම් ... ... ... | 1,000 | 0 | 2. පොත්පත් ආදිය ... ... ... | 1,000 | 0 |

සී. ආර්. ඒ. සමරක්කොඩි,
ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

නගර සභා කාර්යාලය,
ගම්පහ, 65.9.6.

9–803/2—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## කඩුගන්නාව පළාත් ආණ්ඩු සභාව

### අතිරේක වැය ලේඛනය අංක 2—1965

| වැය ශීර්ෂය | රු. | ශ. | යෝජනා අංකය |
|---|---|---|---|
| ඊ.—මහජන සෞඛ්‍යය :— | | | |
| (3) වැසිකිළි ශුද්ධ කිරීම— | | | |
| (සී) ගබඩා බඩු ... ... ... | 200 | 0 | ... 1965 8.27 අංක 7 |
| (6) ආරෝග්‍ය ශාලා— | | | |
| (බී) නඩත්තුව ... ... ... | 8,500 | 0 | ... එම |
| (ඩී) ජීවනාධාර ... ... ... | 550 | 0 | ... එම |
| | 9,250 | 0 | |

ජෝර්ජ් ගුණසේකර,
සභාපති වෙනුවට,
කඩුගන්නාව පළාත් ආණ්ඩුසභාව.

පළාත් ආණ්ඩුසභා කාර්යාලය,
කඩුගන්නාව, 1965.9.7.

9 —823/1—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## කඩුගන්නාව පළාත් ආණ්ඩු සභාව

### මුදල් රෙගුලාසි අංක 12 (11) යටතේ කෙරෙන අයැදුම්පතයි

### 1965 අය වැය ලේඛනය

1965 අය වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන්කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත දක්වෙන වැය ශීර්ෂ යටතේ සඳහන් මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර, අවශ්‍යවී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1965 ක්වූ අගෝස්තු මස 27 වෙනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 7 දරණ යෝජනාවෙන් සම්මතවී තිබේ.

**1965 අය වැය ලේඛනයේ වෙන්කර තිබෙන මුදල් වලින් ඉතිරි වේයයි ගණන් බලන ලද ශීර්ෂයන් හා මුදල්**

| | රු. | ශ. |
|---|---|---|
| ඩී.—පළාත් ආණ්ඩුසභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| (7) අළුත් වැඩ ... ... ... | 1,000 | 0 |
| ඊ.—මහජන සෞඛ්‍යය— | | |
| (1) සාමාන්‍ය වැය— | | |
| (ජී) වතුර බැස්සීමේ කාණු තැනීම ... ... | 1,000 | 0 |
| ඊ.—5. ජලසම්පාදනය— | | |
| (ඩී) ඉඩම් ලබාගැනීම ... ... | 500 | 0 |
| ජී.—සොහොන්බිම්— | | |
| (2) නඩත්තුව ... ... ... | 2,000 | 0 |
| ඇම්.—කියවීම් ශාලා සහ පුස්තකාල— | | |
| (3) ද්‍රව භාණ්ඩ ... ... ... | 1,000 | 0 |
| (6) සංවර්ධන ... ... ... | 4,000 | 0 |
| එකතුව ... | 9,500 | 0 |

**අතිරේක වැය අවශ්‍යවී තිබෙන ශීර්ෂයන් හා මුදල්**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (1) නිළධාරීන්ගේ වැටුප්— | | |
| (ඊ) විශ්‍රාම වැටුප් ... ... ... | 50 | 0 |
| (2) කාර්ය මණ්ඩලීය වියදම්— | | |
| (ඒ) අමතර දීමනා ... ... ... | 50 | 0 |
| සී.—තානායම් සහ අම්බලම්— | | |
| (2) නඩත්තුව ... ... ... | 100 | 0 |
| ඊ.—මහජන සෞඛ්‍යය— | | |
| (2) කුණුකසළ බැහැරලීම— | | |
| (ඒ) පඩිනඩි ... ... ... | 1,800 | 0 |
| (සී) ගබඩාබඩු ... ... ... | 100 | 0 |
| (ඊ) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ... ... | 1,650 | 0 |
| ජේ.— විදුලි දෙපාර්තමේන්තුව— | | |
| (3) කම්බිවලට සහ නිවෙස්වලට යාකිරීමේ සේවයන්— | | |
| (ඒ) ද්‍රව්‍ය ... ... ... | 5,000 | 0 |
| (4) පාලනය සහ සාමාන්‍ය වියදම්— | | |
| (එච්) විශ්‍රාම වැටුප් ... ... ... | 750 | 0 |
| එකතුව ... | 9,500 | 0 |

ජෝර්ජ් ගුණසේකර,
සභාපති වෙනුවට,
කඩුගන්නාව පළාත් ආණ්ඩුසභාව.

පළාත් ආණ්ඩුසභා කාර්යාලය,
කඩුගන්නාව, 1965.9.7

9–823/2—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

**මුදල් රෙගුලාසි අංක 12 (11) යටතේ කෙරෙන අයදුම් පත්‍රයි**

### 1965 අය වැය ලේඛනය

1965 අයවැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන්කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත දැක්වෙන වැය ශීර්ෂ යටතේ සඳහන් මුදල්, ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂවලට මාරුකර, අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1965 ක්වූ අගෝස්තු මස 28 වෙනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 15 (12) දරණ සභා තීරණයෙන් සම්මත වී තිබේ.

| 1965 අයවැය ලේඛනයේ වෙන්කර තිබෙන මුදල් වලින් ඉතිරිවේයයිගණන් බලන ලද ශීර්ෂයන් හා මුදල් | රු. | ශ. | අතිරේක වැය අවශ්‍යව තිබෙන ශීර්ෂයන් හා මුදල් | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | | ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| 4 (සී)—ආහාර නිෂ්පාදන කටයුතු පිළිබඳ වියදම් ... | 730 | 0 | 1. නිලධාරීන්ගේ වැටුප්— | | |
| ඊ.—මහජන සෞඛ්‍යය :— | | | (ඊ) විශ්‍රාම වැටුප් ... ... ... | 700 | 0 |
| 5. ජල සම්පාදනය— | | | 2. කාර්ය මණ්ඩලීය වියදම්— | | |
| (ජී) බදු එකතු කරන්නන්ට කොමිස් ... ... | 100 | 0 | (බී) ගමන් ගාස්තු ... ... ... | 130 | 0 |
| එකතුව ... | 830 | 0 | එකතුව ... | 830 | 0 |

ලීලාරත්න විජේසිංහ,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
අවිස්සාවේල්ල, 1965.9.7.

9–826—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## වේයන්ගොඩ සුළු නගර සභාව

**මුදල් රෙගුලාසි අංක 40 (11) යටතේ අයදුම් පත**

### 1965—අය වැය ලේඛනය

පහත දක්වෙන ඉතිරි මුදල් යටතේ සඳහන් වැය ශීර්ෂවලින් රු. 4,450.00 ක් වැඩිපුර වියදම් යටතේ සඳහන් වැය ශීර්ෂවලට මාරුකර ඉන් වැය කිරීමට, එක් එක් වැය ශීර්ෂවලට ඉදිරියෙන් සඳහන් කර ඇති අංක දරණ යෝජනාවලින් සභා සම්මත කර ගන්නා ලදී.

| ඉතිරි වැය | රු. | ශ. | අතිරේක වැය | රු. | ශ. | |
|---|---|---|---|---|---|---|
| සී. 7 අළුත් වැඩ ... ... | 2,000 | 0 | ඩී. 5ඊ ඉදිකිරීම් ... ... | 2,000 | 0 | යෝජනා අංක 13 සහ 1965.3.30 දින |
| ඒ 2ඊ අධිකරණ ගාස්තු ... ... | 300 | 0 | ඩී 3සී ගබඩාබඩු ... ... | 300 | 0 | යෝජනා අංක 13 සහ 1965.6.29 දින |
| බී 2 නඩත්තුව ... ... ... | 800 | 0 | ඒ 4 ආධාර හා පාරිතෝෂික දීමනා ... | 300 | 0 | යෝජනා අංක 25 සහ 1965.7.27 දින |
| ඩී 1ජේ සෞඛ්‍ය සති දීමනා ... ... | 50 | 0 | ඩී 3බී කරත්ත ගොන් සහ ලොරි ... | 800 | 0 | |
| අෆ් 2 නඩත්තුව ... ... | 200 | 0 | | | | |
| අයි 1 ගිනි නිවීමේ උපකරණ සඳහා වියදම් ... | 50 | 0 | | | | |
| | 3,400 | 0 | | 3,400 | 0 | |

### දෙවෙනි කොටස—විදුලි අංශය

| | රු. | ශ. | | රු. | ශ. | |
|---|---|---|---|---|---|---|
| ඊ.ඇල්. 6 වැඩිදියුණු හා දීර්ඝ කිරීම් ... | 50 | 0 | ඊ ඇල්. 8 ... ... | 50 | 0 | යෝජනා අංක 19 සහ 1965.5.29 දින |
| ඊ.ඇල්. 4 ඩී විවිධ ... ... | 1,000 | 0 | ඊ ඇල්. 2ඩී විදුලි මාර්ග මූල නාඩි නඩත්තුව ... | 1,000 | 0 | යෝජනා අංක 25 සහ 1965.27.7 දින |
| | 1,050 | 0 | | 1,050 | 0 | |

ජී. ඒ. ඩී. ඇල්. තිලකරත්න,
වේයන්ගොඩ නගර සභාවේ සභාපති.

නගර සභා කාර්‍යාලය,
වේයන්ගොඩ, 1965.9.9.

9–837—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## මහරගම නගර සභාව

**1965 වර්ෂයේ දෙවෙනි පරිපූරක අයවැය ලේඛනය**

### I කොටස—සාමාන්‍ය

| ශීර්ෂය හා උප ශීර්ෂය | විස්තරය | මුදල රු. ශ. |
|---|---|---|
| ඒ 2 (ඊ) ... | නීති පිළිබඳ කටයුතු ... ... | 2,000 0 |
| ඩී 5 (ඊ) ... | ඉදිකිරීම ... ... ... | 1,000 0 |

1965.6.11 වෙනි දින විශේෂ සභා රැස්වීමේ අංක 4 දරණ යෝජනාවෙන් සභා සම්මත කෙරින.

ඩබ්ලිව්. සිරිසේන පෙරේරා,
සභාපති,
මහරගම නගර සභාව.

1965 සැප්තැම්බර් මස 7 වෙනි දින,
නගර සභා කායර්‍යාලය,
මහරගම.

9–813—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## නාත්තන්ඩිය සුළු නගර සභාව

**1965 වර්ෂයේ තුන්වැනි පරිපූරක අයවැය ලේඛනය**

### 1 වැනි කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂය | මුදල රු. ශ. |
|---|---|
| ඒ—සාමාන්‍ය වියදම් :— | |
| 1 (එච්) නිල ඇඳුම් ... ... | 100 0 |
| 2 (ඊ) නීතියේ කටයුතු සඳහා ... ... | 250 0 |
| බී—මහා මාර්ග :— | |
| 2 නඩත්තු කිරීම ... ... | 470 0 |
| ඊ—මහජන විනෝදය :— | |
| 7 විනෝද බද්ද පරීක්ෂණයට ... ... | 100 0 |
| එකතුව... | 920 0 |

### 2 වැනි කොටස—විදුලි අංශය

| වැය ශීර්ෂය | මුදල රු. ශ. |
|---|---|
| 3 සේවය හා නිවාසයනට විදුලි කම්බි සම්බන්ධ කිරීම :— | |
| (ඒ) උපකරණ ... ... | 1,000 0 |
| එකතුව ... | 1,000 0 |

1965.8.13 දින පැවැත්වූ සභා රැස්වීමේදී අංක 6 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

ඒ. ඇම්. තාහිර්,
වැඩ බලන සභාපති.

1965.8.26 දින,
නත්තන්ඩිය සුළු නගර සභා කාර්යාලයේ දී.

අනුමත කරන ලදී.

සහකාර පළාත් පාලන කොමසාරිස්,
(ව. කො.)

1965.9.6 දින,
කුරුණෑගල දීය.

9–802—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## මීරිගම සුළු නගර සභාව

**1965 වර්ෂයේ පළමුවැනි අතිරේක වැය ඇස්තමේන්තුව**

| වැය ශීර්ෂය | ගණන රු. ශ. |
|---|---|
| ඒ — 1 (ඒ) ලේකම් ... ... | 297 00 |
| ඒ — 1 (බී) ලිපිකරුවන් ... ... | 166 00 |
| ඒ — 1 (සී) ආදායම් පරීක්ෂකයන් ... ... | 100 00 |
| ඒ — 1(ජී) ජීවන හා විශේෂ ජීවන ආධාර ... | 165 00 |
| ඊ — 4 සතුකොට ගැනීම ... ... | 13,183 00 |
| මුළු ගණන ... | 13,911 00 |

1965 අගෝස්තු මස 12 වැනි දින පවත්වන ලද මීරිගම සුළු නගර සභාවේ සාමාන්‍ය මාසික රැස්වීමේදී අංක 5 දරණ යෝජනා සම්මතයෙන් සභා සම්මත කර ගන්නා ලදී.

ජේ. ඊ. අමරතුංග,
සභාපති,
මීරිගම සුළු නගර සභාව.

අනුමත කරන ලදී.

ඩබ්ලිව්. ඊ. වී. ඇස්. ද අල්විස්,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
(බ. ප.)

1965.9.7 දින,
කොළඹ දීය.

9–827—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## මිනුවන්ගොඩ සුළු නගර සභාව

**මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ කෙරෙන අයදුම්පතයි**

### අයවැය ලේඛනය—1965

1965 වර්ෂයේ අය වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදලින් ඉතිරිවෙයයි ගණන් බලන ලද පහත දැක්වෙන ශීර්ෂ යටතේ වූ මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂවලට මාරුකර අවශ්‍ය වී තිබෙන වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදවීමට වර්ෂ 1965 ක්වූ අගෝස්තු මස 30 වන දින පැවැත්වුණු මාසික සභා රැස්වීමේ අංක 14 දරණ යෝජනාවෙන් සභා සම්මත වී තිබේ.

**ඉතිරි මුදල් වැය ශීර්ෂය**

| | | රු. ශ. |
|---|---|---|
| ඒ 1 (ඈජ්)— | විශ්‍රාම වැටුප් ... ... | 450 0 |
| ඒ 2 (ඩී)— | තක්සේරු කර. කොමිස් ... ... | 300 0 |
| ඒ 2 (ඊ)— | නීතියේ කටයුතු ... ... | 700 0 |
| ඒ 2 (එච්)— | ගණකාධිකාරි ගාස්තු ... ... | 250 0 |
| බී 2— | මාර්ග නඩත්තුකිරීම ... ... | 1,750 0 |
| සී 1— | න. ස. ගො. ඉ. වේතන ... ... | 250 0 |
| ඩී 2 (ඒ)— | කශල ශෝ. වේතන ... ... | 600 0 |
| ඩී 2 (ඊ)— | කශල ශෝ. ජීවනාධාර ... ... | 1,260 0 |
| ඩී 7 (ජී)— | වෙළඳසැල් ණයගාස්තු ... ... | 2,000 0 |
| | එකතුව ... | 7,560 0 |

**වැඩිපුර මුදල් වැය ශීර්ෂය**

| | | රු. ශ. |
|---|---|---|
| ඒ 1 (ඒ)— | සේව. වැටුප් ලේ. ... ... | 200 0 |
| ඒ 1 (බී)— | සේ. වැ. ලිපික. ... ... | 1,200 0 |
| ඒ 1 (ඩී)— | සේ. වැ. පියන්. ... ... | 50 0 |
| ඒ 1 (ජී)— | සේ. වැ. ජී. ආ. ... ... | 1,000 0 |
| ඒ 2 (සී)— | බදු අයක. කො. ... ... | 50 0 |
| සී 4— | න. ස. ගො. නඩ. ... ... | 500 0 |
| සී 8— | න. ස. ගො. ජී. ... ... | 260 0 |
| ඩී 1 (ඈජ්)— | ස. විෂ නා. දු. ... ... | 100 0 |
| ඩී 3 (ඒ)— | වැසි. ප. වේතන ... ... | 800 0 |
| ඩී 3 (බී)— | වැසි. ප. ක. ගො. ... ... | 1,200 0 |
| ඩී 5 (සී)— | ජල සම්. නඩත්තු ... ... | 750 0 |
| ඩී 7 (බී)— | වෙළඳසැල් නඩ. ... ... | 700 0 |
| ඊ 2— | ම. විනොද නඩ ... ... | 250 0 |
| ඊ 7— | විනෝ. බ. පරී. ... ... | 150 0 |
| එච් 1— | කිරු. මී. පරි. ගා. ... ... | 150 0 |
| ජේ 5— | කි. ශා. පුස්. නඩ. ... ... | 200 0 |
| | එකතුව ... | 7,560 0 |

ඩී. ඩී. විජේතුංග,
සභාපති,
මිනුවන්ගොඩ සුළු නගර සභාව.

1965 සැප්තැම්බර් මස 8 වන දින,
මිනුවන්ගොඩ සුළු නගර සභා කායර්‍යාලයේ දීය.

9–828—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## කඩුවෙල ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1965 වර්ෂයේ සැප්තැම්බර් මස 1 වෙනි දින පටන් 1965 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා කාලයට සතුන් මරා විකිණීම සඳහා අවසර පත්‍ර ඉල්ලා අයදුම් පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වෙනි පරිච්ඡේදයේ) 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ. එම බලපත්‍රය නිකුත් කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ගම්සභා ප්‍රදේශයේ ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන කරුණු නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 7ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
| --- | --- | --- |
| 1. ඇල්බට් රණසිංහ මහතා ... | ... හරක් මස් වෙළඳාම | ... වැලිවිට මංසන්ධියේ කඩේවත්ත නම් ස්ථානයේ |
| 2. ඇස්. ඇම්. ශේඛු දාවූදු මහතා ... | ... එම | ... කඩුවෙල ගම්සභාවට අයත් කඩුවෙල මධ්‍යම වෙළඳ පොල |

ඩී. පී. ඒ. ඩයස්,
කඩුවෙල ගම්සභාවේ සභාපති තැන.

1965 සැප්තැම්බර් මස 7 වෙනි දින,
කඩුවෙල ගම්සභා කාර්යාලයේ දීය.

9–830—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## කම්මල්පත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1965 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලා අයදුම් පතක් මා වෙත ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍රය නිකුත්කිරීම ගැන, කම්මල්පත්තු ගම්සභා ප්‍රදේශ සීමාවතුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එය කුමණ කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මම දැන්වීම ගැසට් පත්‍රය් පළවූ දින සිට 14 දිනක් ඇතුලත මා වෙත එවිය යුතු බව දන්වා සිටිමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
| --- | --- |
| 1. ජේ. ඇම්. මනුවෙල් ප්‍රනාන්දු, බස්නාහිර නයිනමඩම, වෙන්නප්පුව. | බස්නාහිර නයිනමඩම, එළුහරක් මස්, ඌරු මස් සහ එළු මස් කඩය. |

සී. බෙනඩික් ප්‍රනාන්දු,
කම්මල්පත්තු ගම්සභාවේ සභාපති තැන.

1965ක් වූ සැප්තැම්බර් මස 3 වෙනි දින,
වෙන්නප්පුව, දුම්මලදෙණියේ පිහිටි
කම්මල්පත්තු ගම්සභා කාර්යාලයේදීය.

9–833—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## වත්තේගම නගර සභාව

### නගර සභා ආඥාපනත

### 1965 වර්ෂය සඳහා වූ කසළ ශෝධනය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරයේ) 130 (බී) වගන්තිය යටතේ, අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රකාශයට පත් කෙරෙන සීමාවන්ට හා අස්කිරීම්වලට යටත්ව, පිළිවෙලින් මාර්තු 31 දයින්, ජූනි 30 දයින්, සැප්තැම්බර් 30 දයින්, හා දෙසැම්බර් 31 දයින් අවසන්වන අයුරු සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ, ඉකුත් වූ වර්ෂයේ බල පැවැත්වෙමින් තිබුණ පරිදිම, වත්තේගම නගර සභා සීමාව තුළ තිබෙන සියලුම නිශ්චල දේපළවල වටිනාකමින් සියයට හයක විශේෂ කසළ ශෝධන බද්දක් 1965 වර්ෂය සඳහා වත්තේගම නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී. ධර්මසිරි,
සභාපති,
වත්තේගම පළාත් ආණ්ඩු සභාව.

1965.8.5,
පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
වත්තේගම.

9–817/1—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## වත්තේගම නගර සභාව

### නගර සභා ආඥාපනත

### 1965 වර්ෂය සඳහා වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරයේ) 130 (බී) වගන්තිය යටතේ, අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රකාශයට පත් කෙරෙන සීමාවන්ට හා අස්කිරීම්වලට යටත්ව, පිළිවෙලින් මාර්තු 31 දයින්, ජූනි 30 දයින්, සැප්තැම්බර් 30 දයින්, හා දෙසැම්බර් 31 දයින් අවසන්වන අයුරු සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ, ඉකුත් වූ වර්ෂයේ බල පැවැත්වෙමින් තිබුණ පරිදිම, වත්තේගම නගර සභා සීමාව තුළ තිබෙන සියලුම නිශ්චල දේපළවල වටිනාකමින් සියයට හයක විශේෂ ජල බද්දක් 1965 වර්ෂය සඳහා වත්තේගම නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී. ධර්මසිරි,
සභාපති,
වත්තේගම පළාත් ආණ්ඩු සභාව.

1965.8.5,
පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
වත්තේගම.

9–817/2—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## දකුණු විලච්චිය කෝරළේ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙම උපලේඛනයේ නම සඳහන් අය එහි සඳහන් ස්ථානයේදී 1965 වර්ෂය වෙනුවෙන් සතුන් මරා විකිණීම සඳහා අවසර පත්‍රයක් ඉල්ලා අයදුම් පතක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ "201 වෙනි පරිච්ඡේදයේ" 1947 අංක 44 දරණ සංශෝධිත පනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ. එම බලපත්‍රය නිකුත් කිරීම ගැන දකුණු විලච්චිය කෝරළේ නොච්චියගම ගම් ප්‍රදේශයේ යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් ඔහු හෝ ඈ එසේ විරුද්ධවන්නේ කුමණ කරුණු නිසාද යනවග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 7ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම | ස්ථානය |
| --- | --- | --- |
| 1. ඇස්. එච්. ජෙමාල්දීන් | එළහරක් මස් කඩය | නොච්චියගම නගරයේ අංක 16 දරණ ස්ථානයේ |

එච්. වී. සුද්දහාමි,
දකුණු විලච්චිය කෝරළේ ගම්සභාපති තැන.

1965 ක් වූ සැප්තැම්බර් මස 6 වන දින,
දකුණු විලච්චිය කෝරළේ ගම්සභා කාර්යාලය,
නොච්චියගම.

9–811—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරව පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි